ඩාබිඳු සාමූහික සංගමය
டாபிந்து கூட்டு ஒன்றியம்
DABINDU COLLECTIVE UNION

# 2024 ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සඳහා වූ ප්‍රකාශය

අද දින ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහි ක්‍රියාකාරීත්වයේ දින 16 සමාප්තියයි. මෙය නිමිත්තෙන්, ඩාබිඳු සාමූහික සංගමය ශ්‍රී ලංකාවේ වැඩ ලෝකයේ ප්‍රචණ්ඩත්වය සහ හිංසනයෙන් තොර ආරාක්ෂිත වැඩ ලෝකයක් සහතික කිරීම උදෙසා නව රජයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ගයන් කඩිනමින් ස්ථාපිත කරන ලෙස ඉල්ලා සිටී.

1. ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ C-190 සම්මුතිය, එනම් ප්‍රචණ්ඩත්වයෙන් හා හිංසනයෙන් තොර වැඩ ලෝකයක් සඳහා සෑම කෙනෙකුටම ඇති අයිතිවාසිකම් පිළිගන්නා සම්මුතිය, අපරානුමත කළ යුතුය.

2. හිංසන විරෝධී නීතියක් සම්පාදනය කිරීම සහ එය කම්කරු නීතිවලට අන්තර්ගත කර, එය ක්‍රියාත්මක කිරීමට ඵලදායී යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම.

3. යහපත් සේවා පරිසරයක් විශේෂයෙන්ම වැඩ ලෝකයේ ප්‍රචණ්ඩත්වය නිසි ලෙස ආමන්ත්‍රණය කිරීමටත් කම්කරු ප්‍රතිලාභ සහ සේවා කොන්දේසි සඳහා තීන්දු ගැනීමටත් ජාතික කම්කරු උපදේශක සභාව තුළ කාන්තා නායකත්වයෙන් යුත් වෘත්තීය සමිති නියෝජනයන් කම්කරු අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය.

4. ජාතික අවම වැටුප ජීවත් වීමට සරිලන සාධාරණ වැටුපක් බවට පත් කිරීමට මූලික වැටුප රු. 55,700ක් දක්වා වැඩි කිරීම සහ අර්බුධකාරී අවස්ථාවලට අයවැය සහන දීමනා ලබා දීමට කටයුතු කිරීම.

5. ලිංගික සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූ කාන්තාවන්ට ප්‍රවේශ විය හැකි රැකවරණ මධ්‍යස්ථාන සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම.

6. සනීපාරක්ෂක තුවා සඳහා වන බදු ඉවත් කිරීම සහ කර්මාන්තශාලාවල නොමිලේ සනීපාරක්ෂක තුවා අඛණ්ඩව ලබා දීම.

7. සියලුම කාන්තාවන් සඳහා සේවා ස්ථානවල පිරිසිදු ජලය සහ ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.

8. සංගමයේ නිදහස සඳහා සේවිකාවන්ගේ ව්‍යවස්ථාපිත අයිතිය තහවුරු කරමින්, වෘත්තීය සමිතිගත වීම හේතුවන් සේවායෝජකයා එල්ල කරන පළිගැනීම්වලින් සහ දඬුවම්වලින් ආරක්ෂා වීමට නීතිය ක්‍රියාත්මක කිරීම.

9. කම්කරු කාන්තාවන්ගේ රැකියා සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ සමාජ ආරක්ෂණය සහතික කිරීම සඳහා කම්කරු නීති ශක්තිමත් කිරීම.

10. කම්කරු කාන්තාවන්ගේ සුරැකුම් වැඩවලට සහාය වීමට විශ්වීය ප්‍රවේශයක් සහිත දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් සැපයීම.

11. කම්කරු දෙපාර්තුමේන්තුව හරහා මැන්පවර් සේවය අඛණ්ඩව අධීක්ෂණය කිරීම.

සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් තොරව ජීවත්වීමේ අයිතිය මූලික මානව අයිතිවාසිකමක් ලෙස තහවුරු කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාවය අපි අවධාරණය කරමු.

**කාන්තා අරගලයට ජය!**

No. 221, Welaboda Road, Katunayake, Sri Lanka.
Tel: +94 11 4 851 383 | Email: dabindu.infoco@gmail.com | Web: www.dabinducollective.org | Registration No - 9194